# ගම් වැඩුමට තැනෙන පිඹුරු පත

## සැලසුම් කිරීමේ විවිධ අවස්ථා

වර්තමාන රජයේ ආර්ථික ප්‍රතිපත්ති අනුව, දේශීය නිෂ්පාදන සහ රැකීරක්ෂා අවස්ථාවන් වැඩි කිරීමටත්, විදේශ විනිමය ඉපයීමටත්, සියලු මාර්ග තුළින් ජනතාවගේ ආදයම් සහ ජීවන තත්වය උසස් කිරීමටත් ප්‍රධාන විශාල ව්‍යාපාර හතරක් ආරම්භ කරන ලදී. එනම් මහවැලි සංවර්ධන ව්‍යාපාරය, නිදහස් වෙළඳ, කලාපය, නාගරික සංවර්ධන වැඩ සටහන සහ නිවාස සංවර්ධන වැඩ පිළිවෙලයි. මේ වැඩ සටහන් තුළින් සම්ප්‍රදයික ග්‍රාමීය අංශයේ වෙසෙන ජනතාවට රැකී රක්ෂා අවස්ථාවන් උදවූයේත් ඔවුන්ගේ ආදයම් හා ජීවන තත්වයන් වක්‍ර ආකාරයෙන් හෝ උසස් වීම සිදුවූයේත් ඔවුන්ගේ සියලු අවශ්‍යතාවන් සපිරෙන අයුරින් නොවේ. එම්නිසා මෙරට ජනතාව ගෙන් 70% ක් පමණ දෙනා වාසය කරන ගම්බද ප්‍රදේශයන්හි ආර්ථික, සමාජීය හා ආයතනික දියුණුව උදෙසා ඉහත කී ප්‍රධාන ව්‍යාපාරයන් ගෙන් පරිබාහිර වූ විශෙෂ වැඩ සටහන් අවශ්‍ය විය. දිස්ත්‍රික් ඒකාබද්ධ ග්‍රාමීය සංවර්ධන වැඩ සටහන මෙම අවශ්‍යතාව සපුරා ලීම සඳහා දියත් කරන ලද්දකි. දනට මෙවැනි ව්‍යාපෘතීන් දිස්ත්‍රික්ක හයක පමණ ක්‍රියාත්මක වෙමින් පවතී.

එහෙත් දිස්ත්‍රික්කයක් වැනි විශාල ප්‍රදේශයක් සංවර්ධනය කිරීම සඳහා සැලසුම් සකස් කිරීමේදී ප්‍රාදේශීය හා ගම්මට්ටමේ පවතින විවිධ අවශ්‍යතාවන් නිත්‍ය වශයෙන්ම සැලැකිල්ලට ගැනීම අපහසු වේ. දිස්ත්‍රික් සැලසුම් වලදී බොහෝ විට සැලකිල්ලට ගැනෙන්නේ මුලු දිස්ත්‍රික්කයම සමස්ථයක් වශයෙන් ගත් කළ දියුණු කළ යුතු විශේෂ අංශයන් කීපයක් පමණි. වැඩිදුරටත්, ග්‍රාමීය ජනතාවගේ ආර්ථික හා සමාජයීය ප්‍රශ්න විසඳිය හැකි අන්දමේ සාර්ථක සැලැස්මක් සකස් කිරීමට නම්,ගම් මට්ටමෙන් සැලසුම් කිරීම අවශ්‍ය වේ.

ග්‍රාමසේවක කොට්ඨාශ මට්ටමෙන් සැලසුම් සකස් කිරීම සඳහා ග්‍රාමෝදය මණ්ඩලද, ප්‍රාදේශීය


නියෝජ්‍ය අධ්‍යක්ෂ (අලෙවි පර්යේෂණ)

**පී. ජේ. ගුණවර්ධන විසිනි.**

මට්ටමේදී එම සැලසුම් ඒකාබද්ධ කොට ප්‍රාදේශීය අවශ්‍ය සැලසුම් ක්‍රියාත්මක කිරීම සඳහා ප්‍රාදේශීය මණ්ඩලද, දිස්ත්‍රික්ක මට්ටමෙන් ඒවා සැලකිල්ලට ගෙන ක්‍රියාත්මක කිරීමට දිස්ත්‍රික් සංවර්ධන සභාවන්ද රජය මගින් මෑතකදී පිහිටුවන ලදී. මේ විවිධ මණ්ඩල මගින් ග්‍රාම සංවර්ධනය සඳහා අවශ්‍ය පරිපාලන වශයෙන් ක්‍රියාකාරී වූත් ඒකාබද්ධ වූත් පදනමක් සපයනු ලැබේ යයි අපේක්ෂා කෙරේ. මෙවැනි පරිපාලනමය ව්‍යුහයක් ඇතුළත ග්‍රාම සංවර්ධනය සඳහා ගම් මට්ටමින්ම සැලසුම් සකස් කිරීමේදී සැලකිල්ලට භාජනය වියයුතු කරුණුත් අදළ සැලසුම් පිළියෙල කොට ක්‍රියාත්මක කිරීමේදී අනුගමනය කළයුතු පියවරත් සාකච්ඡා කිරීම මෙම ලිපියේ අරමුණ වේ.

කිසියම් ගම් ප්‍රදේශයක් ගත්කළ එම ප්‍රදේශයටම ආවේනික වූ ආර්ථිකමය හා සමාජයීය ගැටළු මොනවාදැයි නිවැරදිව හඳුනා ගැනීම මූලික මෙන්ම වැදගත් අවශ්‍යතාවකි. එම ප්‍රදේශය සංවර්ධනය කිරීමට අවශ්‍ය උපක්‍රම සකස් කිරීමත් ඒවා ක්‍රියාත්මක කළයුතු ආකාරයත් පිළිබඳ නිවැරදි අවබෝධයක් ලබා ගත හැක්කේ එවිටය. සංවර්ධනය මාර්ගයෙන් කිසියම් කාල සීමාවක් තුළ සපුරා ගැනීමට අපේක්ෂා කරනු ලබන ඉලක්කයන් මධ්‍යස්ථ මට්ටමකින් තක්සේරු කිරීමද වැදගත් අවශ්‍යතාවකි. මෙවැනි කාල පරිච්ඡෙද කිහිපයක් ඇතුළතදී ඉතා ඉහළ මට්ටමක සංවර්ධන ඉලක්කයන් කරා ළඟා වීමට ඉඩකඩ ඇති බැවිනි. මෙවැනි සංවර්ධන ක්‍රියාවලියක පරමාර්ථය විය යුත්තේ කිසියම් නිශ්චිත ප්‍රදේශයක් තුළ පවතින හා එයට පිටින් ලබා ගත හැකි භෞතික, මූල්‍ය හා මිනිස් සම්පත් උපරිම අයුරින්

ප්‍රයෝජනයට ගනිමින්, ඒ මගින් රැකිරක්‍ෂා අවස්ථා ඇතිකරලීම හා ඒ තුළින් ගම්බද ජනතාවගේ ආදායම් හා වත්කම් වැඩි කරලීමයි. ඉතා දිළිඳු ජන කොටස් වල මූලික අවශ්‍යතාවන් සපුරා ගැනීමට හැකි වන ආයතනික හා ආර්ථික පරිසරයක් සකස් කිරීමට විශේෂ පරිශ්‍රමයක් දැරීමට සමහර විට සිදුවනු ඇත. මෙවැනි අවශ්‍යතාවයක වැදගත් කම ඒ ඒ ප්‍රදේශයෙන් ප්‍රදේශයට වෙනස් වීමට ඉඩ තිබේ.



සැළසුමේ පළමු කටයුත්ත: ගම හා සම්පත් හඳුනා ගත යුතුයි.

යම් ප්‍රදේශයක් සඳහා සැලසුමක් සකස් කිරීමට ප්‍රථම එම ප්‍රදේශයේ පවතින භූ විද්‍යාත්මක තත්වය (පස, දේශගුණය, ජල සම්පත්, ජනාවාස රටාව, භූමි පරිභෝගය) සහ සමාජයීය පසුතලය (සංස්කෘතික ලක්ෂණ, සම්ප්‍රදයයන්, ආකල්ප, සමාජ සංස්ථා) ගැන පැහැදිලි අවබෝධයක් ලබා ගත යුතුය. මීළඟ පියවර විය යුත්තේ ඉහත කී භූවිද්‍යාත්මක හා සමාජ පසුබිම යටතේ එම ප්‍රදේශයේ පවතින සම්පත් සහ පහසුකම් පිළිබඳ සංඛ්‍යානමය ලැයිස්තුවක් (ලේඛණයක්) සකස් කිරීමයි. උදාහරණ වශයෙන් පහත සඳහන් දේ මෙයට ඇතුළත් විය හැකිය. එනම් පස, ජල විදුලි බලය නිපදවීමේ හැකියාව, භූගත ඛණිජ සම්පත්, භූමි පරිභෝග රටාව, වගාකර ඇති භෝග, වාරිමාර්ග පහසුකම්, වන සම්පත්, සත්ව සම්පත්, ප්‍රවාහණ පහසුකම්, පණිවුඩ හුවමාරු පහසුකම්, අලෙවි මාර්ග, ගබඩා පහසුකම්, කර්මාන්ත, ජනාවාස, නිවාස, පාසැල්, සමුපකාර, බෙහෙත් ශාලා, ආදියයි. මෙම ලැයිස්තුවට තවත් දේ ඇතුළත් විය හැකිය. මෙකී සම්පත් හා පහසුකම් පිළිබඳ දැනට පවතින තත්වය හා ඒවායින් දැනට අදාළ ප්‍රදේශයේ ජනතාවට ලැබී ඇති ප්‍රයෝජන පිළිබඳව තක්සේරු ක් කිරීම අවශ්‍යය. මෙයට අමතරව මිනිස් සම්පත් පිළිබඳව අධ්‍යයන පැවැත්වීම අත්‍යවශ්‍ය වේ. උදහරණ වශයෙන් රැකිරක්ෂා කරන වයස් කාණ්ඩයට ඇතුළත් වන අයගේ සංඛ්‍යාව, රැකී රක්ෂා වල නියුක්ත සංඛ්‍යාව, රැකියා කාණ්ඩ, රැකියා විරහිත කොටසට අයත් ගණන, රැකියා කරන හා රැකියා නැති අයගේ අධ්‍යාපන මට්ටම් සහ විශේෂ දක්ෂතා, යැපෙන්නන්ගේ සංඛ්‍යාව ආදිය දැක්විය හැකිය. මේ මාර්ගයෙන් සංවර්ධන ක්‍රියාවලියේදී අවධානය යොමු විය යුතු විශේෂ කාණ්ඩ හඳුනා ගැනීමට පිළිවන.

සැලසුම් ක්‍රියාත්මක කිරීමේදී අවශ්‍ය වන මූල්‍ය සම්පත් (මුදල්-ප්‍රාග්ධනය) පිළිබඳව තක්සේරුවක් කිරීම මීළඟ පියවර විය යුතුය. උදහරණ වශයෙන් පහත සඳහන් ප්‍රශ්න නැගිය හැකිය.

i. ප්‍රදේශීය තුළින්ම ලබාගත හැකි මූල්‍ය සම්පත් කවරේද? ප්‍රදේශයේ ජනතාවගේ ඉතිරි කිරීම්, ඔවුන්අතර ඇති විවිධ ණය ගනුදෙනු ක්‍රම (සීට්ටු ආදී) ආදිය මෙයට ඇතුළත් වේ.

ii රජයෙන් සහ විවිධ ස්වේඡා ආයතන මගින් ලබාගත හැකි මුදල් කොපමණද?

iii ඉහත කී මාර්ග දෙකෙන් ලබාගත හැකි මුදල් වල හිඟයක් ඇත්නම් බැංකු හා වෙනත් මූල්‍ය ආයතන වලින් ණය පියවා ගත හැකිද ?

ඉහත කී අධ්‍යයනයන්ගෙන් පසුව, අදල ප්‍රදේශයට අත්‍යවශ්‍යවන සංවර්ධන වැඩ සටහන් (ව්‍යාපෘති)

17 පිටුවට

7 පිටුවෙන්

ප්‍රමුඛතා පිළිවෙලට සකස් කිරීම ආරම්භ කළ හැකිය. උදහරණයක් වශයෙන් කිසියම් ප්‍රදේශයක වැදගත්ම ප්‍රශ්නය වන්නේ වී නිෂ්පාදනය පිළිබඳ විද්‍යාත්මක දියුණුවක් නැති කම නම්, වැඩි දියුණු බීජ වර්ග, පොහොර, කෘෂි රසායනික ද්‍රව්‍ය ආදිය ගොවීන්ට ලබා ගත හැකි වනසේ යෙදවුම් සැපයීමේ මාර්ග දියුණු කිරීමටත්, වාරිමාර්ග දියුණු කිරීමටත්, අලෙවි ක්‍රම ව්‍යාප්ත කිරීමටත්, අවශ්‍ය වැඩ පිළිවෙල සඳහා ප්‍රමුඛතා දිය යුතුය. තවත් උදහරණයක් ගතහොත්, කිසියම් ප්‍රදේශයක මූලික ප්‍රශ්නය කර්මාන්ත සඳහා අමුද්‍රව්‍ය තිබුණත් ඒවායින් නිසි ප්‍රයෝජනය ලබා ගැනීමට අවශ්‍ය ශිල්පීය ඥානය හා ප්‍රාග්ධනය නොමැතිකම නම් එම ප්‍රශ්න මහ හරවා ගෙන යෝග්‍ය කර්මාන්ත පිහිටුවීමේ මාර්ග පිළිබඳව ප්‍රමුඛතාවය දීම වැදගත් වේ. කෙසේ වුවද ඒකාබද්ධ ආකාරයක ග්‍රාම සංවර්ධනය සඳහා සැලසුම් කිරීමට නම් නිෂ්පාදනය හා අලෙවිය වැඩි දියුණු කිරීම, රැකියා සැපයීම, පොදු පහසුකම් ලබා දීම යනාදි සියලු කරුණු කෙරේ අවධානය යොමු කිරීමට සිදුවේ. මේ යටතේ දීර්ඝ ලැයිස්තුවක් සැපයිය හැකිය. එහෙත් වැදගත්ම කරුණ වන්නේ ඒ ඒ ප්‍රදේශයට අත්‍යවශ්‍ය වන අංග කෙරේ ප්‍රමුඛතාවයක් ලබා දීමයි. සැලසුම් ක්‍රියාත්මක කිරීම සඳහා අවශ්‍ය මිනිස් බල හා මූල්‍ය සම්පත් මෙන්ම කාල පරිච්ඡේදයන්ද නිශ්චිත හා සීමා සහිත වීම මෙයට හේතුවයි.

කිසියම් ප්‍රදේශයක් සඳහා සකස් කරනු ලබන පොදු සැලැස්ම තුළ විශේෂිතවූ ව්‍යාපෘති කීපයක් ඇතුළත් විය හැකිය. එම ව්‍යාපෘතීන් එකිනෙක සඳහා නිශ්චිත කාල සීමාවක් තුළදී වැයවන වියදම සහ ඒවායින් අත්වන වාසි (නිෂ්පාදනය, රැකිරක්ෂා, ආදයම්) තක්සේරු කිරීමද අත්‍යවශ්‍ය අංගයක්වේ. ආර්ථික වශයෙන් බලන විට වියදම් අඩුම සහ වැඩිම වාසි අත්වන ව්‍යාපෘතීන් තෝරා ගැනීම සාමාන්‍ය පිළිවෙත වේ. මෙවැනි විශේෂිත ව්‍යාපෘතීන්ට උදහරණ වශයෙන් සමූහ ගොවිපලක් හෝ එක් කර්මාන්තයක් දැක්විය හැකිය.